᠎# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1837/5 - 2013 නොවැම්බර් මස 18 වැනි සඳුදා - 2013.11.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/15/10/2008.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2010.01.21 වැනි දිනැති හා අංක 1637/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2010.01.15 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් බුලත්සිංහල, පරගොඩ පාර, කැප්පෙටිපොල මාවත හි පදිංචි උදුලා ඉන්ද්‍රානි දොඩන්ගොඩ මෙනෙවිය හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 7 හෙක්ටර් කොබ්බෑකඩුව මාවත හි පිහිටි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2013.09.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2013 නොවැම්බර් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය : IR//15/10/2008.

කාර්මික අධිකරණයේ දී ය

එක් පාර්ශවයක් වශයෙන්,

උදුලා ඉන්ද්‍රානි දොඩන්ගොඩ මෙනෙවිය,
කැප්පෙටිපොල මාවත,
පරගොඩ පාර,
බුලත්සිංහල.
*ඉල්ලුම්කාරිය*

නඩු අංකය : ඒ/3322

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව,
හෙක්ටර් කොබ්බෑකඩුව මාවත,
කොළඹ 07.

අනෙක් පාර්ශ්වය වශයෙන්

*වගඋත්තරකාර පාර්ශ්වය*

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62, 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල අනුව ඉහත පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරුවෙකු ලෙස 2010.01.15 වෙනි දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

පූර්වෝක්ත දෙපාර්ශ්වය අතර කාර්මික ආරාවුල වූයේ යථෝක්ත යොමුව පරිදි මෙසේය.

01. "ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2000 හා 2001 වර්ෂවලදී v ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර හා iv වන

1 A – G 18550 — 165 (2013/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරුවලට උසස්වීම් ලබා දිමේදී ඒ සඳහා අයදුම් කරනු ලැබූ එහි vii වන ශ්‍රේණියේ ලිපිකාරිනියක් වශයෙන් සේවයෙහි යෙදී සිටි උදුලා ඉන්ද්‍රානි දොඩන්ගොඩ මෙනෙවියට එම උසස්වීම් ලබා නොදීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදු වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමි විය යුතුද ?

02. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2007 වර්ෂයේදී iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරුවලට උසස්වීම් ලබා දීමේදී ඒ සඳහා අයදුම් කරනු ලැබූ vii වන ශ්‍රේණියේ ලිපිකාරිනී දොඩන්ගොඩ මෙනෙවියට එම උසස්වීම් ලබා නොදීම හේතුවෙන්, ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම්, ඇයට කුමන සහනයක් හිමිවිය යුතුද යන්න හා

03. 1995.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ vii වන ශ්‍රේණියේ ලිපිකාරිනියක වශයෙන් ස්ථිර පත්වීමක් ලැබූ උදුලා ඉන්ද්‍රානි දොඩන්ගොඩ මෙනෙවියට එම තනතුරෙහි ශ්‍රේණිගත උසස්වීම් ලබා දීම එම කොමිෂන් සභාව විසින් 2008 වර්ෂය දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමිවිය යුතු ද" යන්න පිළිබඳව වේ.

කාර්මික ආරවුල් පනතේ 39 වැනි වගන්තිය ප්‍රකාර නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් අනුමත කරන ලද නියෝග යටතේ අංක 12731 දරන ගැසට් පත්‍රය අනුව දෙපාර්ශ්වයේ හේතු දැක්වීමේ ලිපි හුවමාරු කරවීමෙන් අනතුරුව ඉහත කී කරුණ සම්බන්ධයෙන් සමථයක් වෙත්දැයි විමසන ලදී. ඒ අනුව සමථයක් නොමැති බැවි හෙළි වූයෙන් විභාගය සඳහා ඉල්ලුම්කාරියට තම නඩුව ඉදිරිපත් කිරීමට ඉඩ සලසා දුනිමි.

ඉල්ලුම්කාරිය වෙනුවෙන් නියෝජිත හේමපාල මහතාද, වගඋත්තරකරු වෙනුවෙන් නීති නිලධාරීතුමිය සහ නීතිඥ පිටවල මහතාද පෙනී සිටියහ. ඉල්ලුම්කාර උදුලා දොඩම්ගොඩ මෙනවිය සිය සාක්ෂි ඉදිරිපත් කරමින් තමා v ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර සඳහා අයදුම්පත් කැඳවූයෙන් ඒ සඳහා තමා ඉල්ලුම් පතක් ඉදිරිපත් කළ බවත්, ඒ සඳහා සම්මුඛ පරීක්ෂණයට සහභාගි වූ බවත් ඉල්ලුම්කාරිය ප්‍රකාශ කළාය. වෙනත් අයවලුන් එකී තනතුර සඳහා තෝරා ගත් අතර, වගඋත්තරකරු කිසිදු අයදුම් පත් කැඳවීමකින් තොරව ඩී.පී.එන්. විජේසේකර, ලියනගේ පද්මසිරි. සමන්ත තුෂාර යන අයවලුන්ට iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර ලබා දුන් බවත් හෙළි කළාය.

තමා 1995.06.01 වෙනි දින vii වන ශ්‍රේණියේ ලිපිකරු තනතුරට පත් වූ බවත්, තමාට (අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) සාමාර්ථයත් තිබූ බවත්, (පැ./01, පැ./02, පැ./03 ඒ බව සනාථ කරයි.) ඊට අමතරව ගම්පහ පොලිටෙක්නික් ආයතනයෙන් කෘෂිකර්ම ඩිප්ලෝමාවක්ද, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු ඉංග්‍රීසි භාෂාව සාමර්ථයද, දෙමළ භාෂා නිපුණතාවය, ජාතික තරුණ සේවා සභාවේ ජපන් භාෂාව පිළිබඳ සහතිකය හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් කුඩා පරිමාණ ව්‍යවසාය අංශයේ ප්‍රථම ස්ථානය හා වෙනත් ආයතන කීපයකින් සහතික පත් ලබා ගත් බවත්, (පැ./04 - පැ./12) සාක්ෂ්‍යාත් කළාය. නියමිත උසස්වීම් නොලැබීම හේතු කොට ගෙන වගඋත්තරකරුට එරෙහිව නඩුව නිමිත්තක් උපවය වී ඇති බවත් තවදුරටත් හෙළි කළාය. ඉල්ලුම්කාරිය සිය පැ./14 ලේඛනය සාක්ෂියට ගැනීමේදී v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර සඳහා 2000.06.26 වෙනි දින අයදුම් කළ බවත්, "මෙම නිලධාරිනියගේ වැඩ හා හැසිරීම සතුටුදායකය, මාණ්ඩලික නිලධාරී තනතුරකට සුදුසු බව අංශ ප්‍රධානියා සහතික කොට ඇති බවත්, (එකී කොටස "ඒ14ඒ" ලෙස සලකුණු කර ඇත. නඩු ගොනුවේ 38 පිටුව) පැ./13 ලේඛනය මගින් iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්කළ ලිපිය ඉදිරිපත් කරන්නීය. එකී ලේඛනයෙහි අධ්‍යක්ෂ (පාලන) ගේ සටහන 13ඒ ලෙස සඳහන් කොට ඇත. ඒ අනුව "විමලා නෝනා මහත්මිය මෙයට අදාළ කොමිෂන් පත්‍රිකාව හදන්න" යනුවෙන් සභාපතිතුමාගේ නියෝගය ඉදිරිපත් කොට ඇත. තවද තමා වගඋත්තරකාර ආයතනයේ අවුරුදු 16ක කාලයක් සේවය කොට ඇති බවද, තමාගේ නඩු කටයුත්ත හේතුවෙන් පාලන අධ්‍යක්ෂතුමාගේ වැටුප් වර්ධක නතර කර ඇති බවත්, තවදුරටත් තමාගේ දුක්ගැනවිල්ල ගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් තමාගෙන් නිදහසට කරුණු විමසූ බවත්, හෙළි කළාය.

තවදුරටත් තම නඩු නිමිත්ත සම්බන්ධව කම්කරු කොමසාරිස්තුමා වෙත කරන ලද පැමිණිල්ල පැ./25 ලේඛනය මගින් ඉදිරිපත් කර ඇත. 2008.01.17 වෙනි දිනැති අංක : CCS/A/DCM/7/392/7/43 දරන කම්කරු කොමසාරිස්ගේ නිරීක්ෂණ වාර්තාව අනුව "ඉහත සඳහන් ඡේද මෙම නිලධාරිනිය මෙම තනතුරට බඳවා ගැනීම සඳහා ක්‍රමයක් අනුමගනය නොකර ආයතනය කටයුතු කර ඇති බැවින් මෙම කාර්මික ආරවුල පැන නැගී ඇත. ආයතනයේ පරිපාලන ව්‍යවස්ථා සංග්‍රහය පාදක කර ගෙන මෙම උසස් කිරීම් පරිපාටිය සිදු වී නොමැති බවට කරන පැමිණිල්ල විසඳුමකට ලක් විය යුතු කරුණු ඇති බැවින් හා ඊට අදාළ කුසලතා ඇති බැවින් මේ සමග ගොනුව අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා එවන බව කරුණාවෙන් දන්වමි." යනුවෙන් කම්කරු කොමසාරිස්ගේ ලිපියෙහි දැක්වේ.

තවද පැ./02 ලේඛනය මත තමා උසස්වීම් සඳහා සම්මුඛ පරීක්ෂණයකට කැඳවන ලද බවත්, එකී පරීක්ෂණය 2000.08.19 හා 20 යන දිනයන්හි පැවති බවත්, අදාළ සම්මුඛ පරීක්ෂණයෙන් තමන්ට වඩා අඩු සුදුසුකම් ඇති ජේ. එම්. ජේ. ජයවර්ධන මහතාට v වන ශ්‍රේණියේ සහ iv වන ශ්‍රේණියේ උසස්වීම් ලබා දී ඇති බවත්, (අදාළ ලේඛනය පැ./09 හා පැ./30 වේ) iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරක වර්ෂ 02ක් කාලයක් හෝ උපාධියක් තිබිය යුතු වුවද, v වන ශ්‍රේණියට පත් වූ ජයවර්ධන මහතා මාණ්ඩලික සහකාර ශ්‍රේණිය 2007.01.01 වෙනි දින වන අතර, iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර 2007.09.14 වෙනි දින ලබා දී ඇති බවත්, දෙවර්ෂයක කාලයක් සපිරිය යුතුව ඇති තනතුර මාස 08 දින 13 සපුරා තිබියදී උසස්වීම අසාධාරණ ලෙස ලබා දී ඇති බවත්, ඉල්ලුම්කාරිය ප්‍රකාශ කොට ඇත.

නඩු ගොනුව - පිටුව/5 හා 2011.01.05 වෙනි දින කාර්ය සටහන අනුව සාක්ෂිකාරිය මෙසේ ප්‍රකාශ කර සිටින්නීය.

"උ : ඔව්. බඳවා ගැනීමේ පරිපාටිය උල්ලංඝනය කර තිබෙන ආයතනයෙන් V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරක් 2007.01.01 වෙනි දිනට ලබා දී එම වර්ෂයේම 2007.09.14 වෙනි දින සහකාර අධ්‍යක්ෂ තනතුරක් ලබා දීම බලවත් උල්ලංඝනය කිරීමක් බව මම අධිකරණයට කියා සිටිනවා" යනුවෙන් සාක්ෂිකාරිය කියා සිටියාය.

තවද වගඋත්තරකරුවන් - ටී. නරේන්ද්‍රනාදන් මහතා, සරත්චන්ද්‍ර මහතා, වන්නිආරච්චි මහතා, චම්පිකා ගමගේ මිය, යූ. පී. ජයවර්ධන මහතා, එස්. සුමිත්‍ර මහතා, තුෂාර ජයවර්ධන මහතා ආදී අයවලුන්ට උසස්වීම් පක්ෂපාතීව ලබා දී ඇති බවත්, ඔවුනට ඇතැම් විට සම්මුඛ පරීක්ෂණවලින් තොරව අයදුම්පත් නොකැඳවමින්, සුදුසුකම් නොමැතිව, උසස්වීම් ලබා දී ඇති බවත් හෙළි කළාය. ලිපිකරු තනතුරේ සිටි ප්‍රදීප් කන්නන්ගර, අරුණ නාකන්ද යන අයටද පටිපාටියෙන් බාහිරව උසස්වීම් ලබා ඇති බව හෙළි කළාය. වගඋත්තරකරුගේ ආයතනයේ ව්‍යවස්ථා සංග්‍රහය වන පැ./33 ලේඛනය 1972 (71) දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ එහි 51 (I) වගන්තිය ප්‍රකාරව සංග්‍රහ කරන ලද ව්‍යවස්ථාවකි. එහි 12 හා 13 වගන්තිවලින් සියළුම බඳවා ගැනීම් සඳහා පටිපාටිය ප්‍රකාශයට පත් කළ යුතු බව දැක්වේ. එහි 19 වගන්තිය අනුව පත්වීමක් කළ යුත්තේ පරීක්ෂණ මණ්ඩලයක් විසින් බවද, අනු අංක 01 හා 02 යටතේ ක්‍රියා කිරීමේදී (01), පුවත්පත් දැන්වීමක් මගින්ද (02), රජයේ ගැසට් පත්‍රයේද පළ කළ යුතු බව දැක්වේ. කොමිසම් සභාවේ සේවකයින් අතර ප්‍රසිද්ධ කළ යුතු වේ.

එහෙත් ඊට පටහැනි ලෙස vii වන ශ්‍රේණියේ ලිපිකරු පී. ඩී. සමන්ත කුමාර, iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ ලෙස 2001.04.02 වෙනි දිනද, vii වන ශ්‍රේණියේ ලිපිකරු ඩී. පී. එන්. විජේසේකර මෙනවිය iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ 2000.10.01 වෙනි දින සිටද, පත් කළ බවට පත්වීම් ලිපිවල පිටපත් පැ./36, පැ./37, පැ./38 වශයෙන් සලකුණු කොට ඉදිරිපත් කර ඇත.

සාක්ෂිකාරිය 2001.06.23 වෙනි දින වගඋත්තරකරු වෙත ඉදිරිපත් කරන ලද මෝසම් පත්‍රය ඉදිරිපත් කර ඇත.

එම මෝසම් පත්‍රය පැ./39 ලෙස සලකුණු කොට ඇත. පැ./39හි මෙසේ දැක්වේ.

2010.05.24 වැනි දින පැවති නඩු විභාගයේදී ගරු අධිකරණයෙන් ලද අවසරය පරිදි පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් පැමිණිලි පාර්ශ්වය වෙත ලබා දීමට වගඋත්තරකාර පාර්ශ්වය වෙත දන්වා යවන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

01. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පරිපාලන ව්‍යවස්ථා සංග්‍රහයේ සහතික කළ පිටපතක්.

02. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ 2000 වසරේ ක්‍රියාත්මක කළ බඳවා ගැනීමේ පරිපාටියේ සහතික කල පිටපතක්.

03. ඉ.ප්‍ර.කො. සභාවේ 2001 වසරේ බඳවා ගැනීමේ පරිපාටියේ සහතික කළ පිටපතක්.

04. ඉ.ප්‍ර.කො. සභාවේ 2007 වසරේ බඳවා ගැනීමේ පරිපාටියේ සහතික කළ පිටපතක්.

05. 2000 වසරේ ටී. නරේන්ද්‍රනාදන් මහතාට V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දීම පිණිස :-

(අ) අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් ;

(ආ) ඒ මහතා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඇ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඇ) සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල ලේඛනයේ සහතික කල පිටපතක් හා ඔහුට එම තනතුර පිරිනැමූ පත්වීමේ ලිපියේ සහතික කළ පිටපතක්.

06. 2001 වසරේ සරත්චන්ද්‍ර පෙරේරා මහතාට V වන ශ්‍රේණියේ මණ්ඩලික සහකාර තනතුර ලබා දීම පිණිස :-

(අ) අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් ;

(ආ) ඒ මහතා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඇ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඇ) සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල ලේඛනයේ සහතික කල ලිපියේ පිටපතක් හා ඔහුට එම තනතුර පිරිනැමූ පත්වීම් සහතික කළ පිටපතක්.

07. vii වන ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරී තනතුර දැරූ නන්දසේන වන්නිආරච්චි මහතාට 2007.09.14 වෙනි සිට සිට iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර ලබා දීම පිණිස :-

(අ) අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් ;

(ආ) ඒ මහතා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඇ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඇ) සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල ලේඛනයේ සහතික කල පිටපතක් හා ඒ මහතාට එම තනතුර පිරිනැමූ පත්වීමේ ලිපියේ සහතික කළ පිටපතක්.

08. vii වන ශ්‍රේණියේ ලිපිකරු තනතුර දැරූ චම්පිකා ගමගේ මහත්මියට 2007 වසරේ V වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දීම පිණිස :-

(අ) අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් ;

(ආ) ඒ මහත්මිය විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඇ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඈ) සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් හා එම මහත්මියට එම තනතුර පිරිනැමූ පත්වීමේ ලිපියේ සහතික කළ පිටපතක්.

09. vii වන ශ්‍රේණියේ ලිපිකරු ලෙස සිටි එස්. සුමිත්‍රා මයාට 2007.09.14 දින සිට v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දීම පිණිස :-

(අ) අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් ;

(ආ) ඒ මහතා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඇ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඈ) සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක්.

10. හිටපු අධ්‍යක්ෂවරයෙකු යූ. ජී. ජයවර්ධන මහතාට iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර ලබා දීම පිණිස :-

(අ) අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් ;

(ආ) ඒ මහතා විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඇ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණයේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඈ) සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් හා එම මහතාට එම තනතුර පිරිනැමූ පත්වීමේ ලිපියේ සහතික කළ පිටපතක්.

11. තුෂාර ජයවර්ධන මහතාට vii වන ශ්‍රේණියේ ලිපිකරු තනතුරට බඳවා ගැනීම පිණිස අයදුම්පතක් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක්. ඒ මහතා ඉදිරිපත් කළ අයදුම්පතේ සහතික කළ පිටපතක් :-

(අ) ඒ මහතා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කල අධ්‍යාපන සුදුසුකම් දැක්වෙන ලේඛනයේ/ලේඛනවල සහතික කළ පිටපත් ;

(ආ) ඒ සඳහා සහභාගී වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ සහතික කළ පිටපතක් හා ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඇ) තුෂාර ජයවර්ධන මහතා v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුරකට පත් කිරීම සඳහා අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් හා ඔහු ඉදිරිපත් කළ අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඈ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ හා ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ඉ) තුෂාර ජයවර්ධන මහතා 2007 වසරේදී iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ ධූරයට පත් කිරීම පිණිස අයදුම්පත් කැඳවීමේ දැන්වීමේ පිටපතක් හා ඔහු ඒ සඳහා ඉදිරිපත් කළ අයදුම්පතේ සහතික කළ පිටපතක් ;

(ඊ) පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නාම ලේඛනයේ හා ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් ;

12. 2007.03.28 දාතමින් ඉ.ප්‍ර.කො. සභාවේ ස්ථිර සේවකයින් සඳහා උසස්වීම් ලබා දීම පිණිස අයදුම්පත් කැඳවූ දැන්වීමේ සහතික කළ පිටපතක් :-

(අ) ඒ අනුව උසස්වීම් ලබා දීමට පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල නාම ලේඛනයේ සහතික කළ පිටපතක් ;

(ආ) එමගින් iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර ලබා ගැනීම පිණිස සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයදුම්කරුවන්ගේ සහ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල ලේඛනයේ සහතික පිටපතක් ;

(ඇ) එමෙන්ම එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ මගින් v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර පිරිනැමීම පිණිස සම්මුඛ පරීක්ෂණය පැවැත්වූ පරීක්ෂණ මණ්ඩල නාම ලේඛනයේ සහතික කළ පිටපතක් සහ සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛනයේ සහතික කළ පිටපතක් ;

පැ./40 වශයෙන් සලකුණු කරන ලද හා වගඋත්තකාර කොමිසමේ මානව සම්පත් සංවර්ධන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද "බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය" පිටු 67කින් සමන්විත ලේඛනයද ඉදිරිපත් කර සිටියාය. පැ./39 කෙරෙහි වගඋත්තරකරුවන් නඩු විභාගය අවසානය තෙක්ම ප්‍රතිචාර දක්වා නැත. අත්‍යාවශ්‍ය කරුණු සනාථ කල යුතුව තිබූ එම මෝසම් පත්‍රයේ ඇති ලිපි ගොනු ඉදිරිපත් නොවීමෙන් ඒවායේ අන්තර්ගත දෑ පිළිබඳව සැක උපදින බවට සාක්ෂිකාරිය කරුණු හෙළි කළාය.

"ප්‍ර : අසාධාරණ ලෙස තමන්ට අහිමි කළ උසස්වීම් ලබා දෙන ලෙස තමයි මේ ගරු අධිකරණයෙන් තමා ගෞරවයෙන් ආයාචනා කර තිබෙන්නේ, හරිද ?

උ : හරි මම ගරු අධිකරණයෙන් ඉල්ලා සිටින්නේ මට ලබා නොදුන් v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර හා iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර හා අධ්‍යක්ෂ තනතුර ලබා දෙන ලෙසය"

යයි සාක්ෂිකාරිය සඳහන් කරමින් ඒ සඳහා තමා සුදුසුකම් සපුරා ඇති බැව් බඳවා ගැනීම් හා උසස් කිරීමේ පටිපාටි සමග සසඳා සාක්ෂි ඉදිරිපත් කර ඇත. නඩු ගොනුවේ 97 පිටුවේ සිට 104 පිටුව දක්වා සිය සුදුසුකම් සනාථ කර ඇත. තවද පැ./44, පැ./45, පැ./46 සහ පැ./47 ලේඛන මගින් වගඋත්තරකරුගේ වගකිව යුතු නිලධාරීන් විසින් ඇයගේ සේවය අගයමින් නිකුත් කරන ලද ලිපි ඉදිරිපත් කර ඇත.

අවසන් වශයෙන් ඉල්ලුම්කාරිය සිය සාක්ෂිය අවසානයේදී වගඋත්තරකරුගෙන් තමන්ට ලැබිය යුතු හිමිකම් පිළිබඳව මෙසේ ප්‍රකාශ කර සිටියාය.

"01. 1995.06.01 වෙනි දින සිට vii වන ශ්‍රේණියේ ලිපිකරු තනතුරට බඳවා ගත් මා හට බඳවා ගැනීමේ පටිපාටිය අනුව වසර 02කින් අනතුරුව එනම්, 1997.06.01 දින සිට vi වන ශ්‍රේණිය ලබා දිය යුතුය. එබැවින් එදින සිට එම ශ්‍රේණියේ පිහිටුවා ඒ මත ලැබිය යුතු හිඟ වැටුප් හා සියළු දීමනා ලබා දෙන ලෙසද ;

02. vi වන ශ්‍රේණියේ වසර 02ක සේවා කාලයකින් පසුව එනම්, 1999.06.01 දින සිට v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර ලබා දී, ඒ මත හිමිවිය යුතු හිඟ වැටුප් හා සියළු දීමනා ලබා දෙන ලෙසද ;

03. බඳවා ගැනීමේ පරිපාටිය අනුව වසර 02කින් පසුව එනම්, 2001.06.01 වෙනි දින සිට v වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුර ලබා දී ඒ මත හිමි විය යුතු හිඟ වැටුප් හා සියළු දීමනා ලබා දෙන ලෙසද ;

04. මේ වන විට විවිධ තනතුරු මත පුළුල් දැනුමක් හා පළපුරුද්දක් ඇති බැවින් ඒ මත අධ්‍යක්ෂ තනතුර ලබා දෙන ලෙසත් වේ." ඒ බව නඩු ගොනුවේ පිටු අංක 107 හා 108 යන පිටුවල සඳහන් වේ.

වගඋත්තරකාර පාර්ශ්වයේ උගත් නීතිඥ මහතාගේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙන ඉල්ලුම්කාරිය තමාගේ කෘෂිකර්ම උපාධිය, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම විසින් පිළිගැනීමට ලක්ව නැති බැව් R/04 හා R/05 යන ලේඛන මගින් කරුණු ඉදිරිපත් කර ඇතත්, අදාළ ඩිප්ලෝමා සහතිකය නිකුත් කර ඇති අතර, ඒ සම්බන්ධව පිළිගැනීමට ලක්ව නැති බැව් සඳහන් කර තිබීම පිළිගත නොහැකිය. හේතුව වගඋත්තරකරුගේ නීතිඥ මහතාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරය පහත දැක්වේ. (2011.06.20 වෙනි දින කාර්ය සටහන් නඩු ගොනුවේ 136 පිටුව ප්‍රකාරව මෙසේ සඳහන් වේ.)

"ප්‍ර : ඔබ වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර සම්මුඛ පරීකෂණවලට පෙනී සිටියා නේද ?

උ : ඔව්.

"ප්‍ර : ඒ අවස්ථාවල අනෙකුත් අය පෙනී සිටියා නේද ?

උ : ඔව්.

"ප්‍ර : ඒ ඔබ සම්මුඛ පරීක්ෂණයට ගිය විට ඔබේ සුදුසුකම් පරීකෂණයට ලක් කළා නේද ?

උ : ඔව්.

"ප්‍ර : අනෙක් අයගේත් සුදුසුකම් පරීක්ෂා කළා නේද ?

උ : පරීක්ෂා කළා. සම්මුඛ පරීක්ෂණ කොපමණ තිබුණත්, සාධාරන අයුරින් තිබුණේ නැහැ. කියා මම කියනවා. ඒ අයට අවශ්‍ය නම් ඒ අයට ලකුණු දෙනවා.

"ප්‍ර : ඔබ එහෙම කියන්නේ ඔබට උසස්වීම් නොලැබුණු නිසා නේද ?

උ : නැහැ. ගන්න ඕනෑ නම් ඒ අයට ලකුණු දීලා හෝ ගන්නවා.

"ප්‍ර : මා ඔබට යෝජනා කරනවා ඔබට උසස්වීම් ලබන්න නොහැකි වුනත් අවශ්‍ය ලකුණු නැති නිසා කියා ?

උ : මා එය ප්‍රතික්ෂේප කරනවා. හිතාමතාම මාගේ ලකුණු අඩු කළා කියා මා කියනවා"

ආදී වශයෙන් ඉල්ලුම්කාරිය කෙරෙහි වගඋත්තකරුවන් දැක්වූ ආකල්පය ඉස්මතු කරමින් හරස් ප්‍රශ්නවලට පිළිතුරු දුන්නාය. තවද වගඋත්තරකාර පක්ෂයේ නීතිඥ මහතාට පිළිතුරු දෙන ඉල්ලුම්කාරිය තමා වෙත අංශයේ රැඳී නොසිටීම හා රාජකාරි පැහැර හැරීම සම්බන්ධයෙන් සහ ලිපි ගොනු පවත්වා ගෙන යාම සම්බන්ධවද අවවාද ලිපි නිකුත් කොට ඇති බවට වගඋත්තරකරුගේ හරස් ප්‍රශ්නවලදී ඉල්ලුම්කාරිය ඒවාට හේතු දක්වා ලිපි යවා ඇති බවත්, හැසිරීම සම්බන්ධව ආයතනය නිකුත් කොට ඇති ලිපි ප්‍රතික්ෂේප කරන බවත් හෙළි කළාය.

වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් එහි මාණ්ඩලික සහකාර සාක්ෂි ඉදිරිපත් කළේය. ඔහු මූලික ප්‍රශ්නවලට පිළිතුරු සපයමින් පැ./51 දරන ලේඛනය අනුව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වර්ෂ 1990 අංක 20 දරන පනතින් බිහි වූ බවත්, එහි සංවර්ධන සැලැස්ම 1995 සැප්තැම්බර් මස 07 වෙනි දින අංක 887/8 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළව ඇති බවත් සාක්ෂාත් කළේය. වගඋත්තරකාර ආයතනය මෙම ඉල්ලුම්කාරියගේ කෘෂිකර්මය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධයෙන් නිර්වචනයක් හෝ පිළිගත හැකි පාඨමාලාවක්ද යන්න විමසා ඇත්තේ ඉහත කී තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමෙනි. " උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලි/ප අංක 167147 යටතේ ගම්පහ බහු තාක්ෂණික ආයතනය පවත්වා ගෙන යනු ලැබූ දෑ අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව'' හඳාරා මෙම ඉල්ලුම්කාරිය උසස් සාමාර්ථයක් ලබා ඇති බවත්, (පැ./49) හෙළිදරව් කරන අතර, පැ./04 නමැති ලේඛනය ඇයගේ අනු අංකය P.T.G 00766 බවත්, ඇයගේ ලි/ප. අංකය 16/14 බවත්, (පැ./52 අනුව) එම සහතිකය නිකුත් කරන ලද දිනය 1989.08.12 බවත්, එහි අත්සන් කරන ලද (01), කළමනාකාර අධ්‍යක්ෂ (02), නියෝජ්‍ය කළමනාකාර අධ්‍යක්ෂ (03), පාඨමාලා අධ්‍යක්ෂ යන තිදෙනාගේ අත්සන්වලින් නිකුත් කරන ලද "Diploma in Agriculture Technology" යන ලේඛනය සාක්ෂි දරා ඇත. ඉහත පැ./04 දරන සහතික පත්‍රය නිර්වචනය/අර්ත නිරූපනය කර ගැනීම සඳහා වගඋත්තරකාර ආයතනය යොමු කොට ඇත්තේ (පැ./51 දරන ලේඛනය) එනම්, තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙතය. පැ./51 අනුව එම ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වූ ටී. ඒ. පියසිරි මහතාගේ 10.07.2008 දිනැති ලේඛනය (පැ./51) එකී ආයතනය 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතින් බිහිව ඇති බව හෙළි වේ. එසේ නම් ආයතනය බිහි වීමටත් පෙර ඉල්ලුම්කාරිය හදාරන ලද ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳ පසුව බිහි වූ වෙනත් ආයතනයකින් විමසීම වැරදි සහගත වේ. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමට මෙම ඉල්ලුම්කාරියගේ ඩිප්ලෝමා සහතිකය අභියෝගයට ලක් කිරීම වගඋත්තරකාර ආයතනය කරන ලද වරදක් මෙන්ම මෙම ඉල්ලුම්කාරියට සිදු වූ මහත් හානියකි. එසේ විමසීම හේතු කොට ගෙන හා මෙම ඉල්ලුම්කාරියගේ ඩිප්ලෝමා පාඨමාලාව පිළිනොගෙන යටපත් වීම හේතු කොට ගෙන ඇයගේ උසස්වීම් සඳහා තිබූ අවස්ථාව පසු පසට ගොස් වෙනත් අයවලුන් ඒ උසස්වීම් සඳහා පත්ව තිබෙන බවට ඇය සාක්ෂි දරයි.

X/01 ලෙස සලකුණු කරන ලද ලේඛනය පහත දැක්වේ.

| අනු අංකය | නම | සේවයට බැඳුණු දිනය | තනතුර හා ශ්‍රේණිය | අධ්‍යාපන සුදුසුකම් | උසස්වීම් ලබා තනතුර/ ශ්‍රේණිය හා දිනය |
|---|---|---|---|---|---|
| 01. | එන්. වන්නිආරච්චි මහතා | 1996.05.30 | vii ශ්‍රේණියේ ක්ෂේත්‍ර නිලධාරී | අ.පො.ස. (සා.පෙළ) | (අ) වැඩ බලන අධ්‍යක්ෂ- iv - 2007.05.16<br>(ආ) සහ. අධ්‍යා-iv-2007.09.14 (2012.08.28 - පී.2 හා 5) |
| 02. | තුෂාර ජයවර්ධන මහතා | 1996.06.03 | vii ශ්‍රේණිය ලිපිකරු (එක් අවුරුදු කාල සීමාවකට) | අ.පො.ස. (සා.පෙළ) | (අ) 2007.01.02 - මා.ස. v ශ්‍රේණිය<br>(ආ) 2007.09.14 - සා.අ. iv ශ්‍රේණිය 2012.08.28-පී-5 හා 7 |
| 03. | එස්. සුමිත්‍ර මහතා | 1998.11.02 | vii ශ්‍රේණිය ලිපිකරු (කොන්ත්‍රාත්) | අ.පො.ස. (සා.පෙළ) | (අ) 2007.09.14 - මා.ස. v (2012.09.18 - පී2 හා 3) |
| 04. | චම්පිකා ගමගේ මිය | 1995.12.01 | vii ශ්‍රේණිය ලිපිකරු (තාවකාලික) | අ.පො.ස. (සා.පෙළ) | (අ) 2007.09.14 - මා.ස. v (2012.09.18 - පී3 හා 4) |
| 05. | එල්. පද්මසිරි මහතා | 1998.11.02 | vii ශ්‍රේණිය ලිපිකරු (කොන්ත්‍රාත්) | ශාස්ත්‍රවේදී උපාධිය | (අ) 2001.01.01 - ස.අ. (2012.09.18 - පී4 හා 5) |
| 06. | ඩී. පී. එන්. විජේසේකර මෙනෙවිය | මෙම නිලධාරීන් සම්බන්ධව පුද්ගලික ලිපිගොනු හෝ අධ්‍යාපන සුදුසුකම් ඉදිරිපත් නොකරන ලදී. | | | |
| 07. | සමන්ත තුෂාර මහතා | | | | |
| 08. | යූ. ජී. ජයවර්ධන මහතා | පුද්ගලික ලිපිගොනු ඇතුළු තොරතුරු ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු අපොහොසත් විය. | | | |
| 09. | උදුලා ඉන්ද්‍රානි දොඩංගොඩ මෙනෙවිය (ඉල්ලුම්කාරිනිය) | 1995.06.01 | ලිපිකාරිනී - vii ශ්‍රේණිය | අ.පො.ස. (සා.පෙළ) අ.පො.ස. (උ.පෙළ) (එක් විෂයක්) ඉංග්‍රීසි/දෙමළ/ජපන් භාෂා පාඨමාලා හා කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව (වසර 02ක්) | vi වන ශ්‍රේණිය - 2007.09.14 |

මෙම ලේඛනය අනුව මෙම ඉල්ලුම්කාරිය වඩාත්ම ජ්‍යෙෂ්ඨත්වයෙන් ඉහළ වුවද, පහළම vi ශ්‍රේණියේ ලිපිකාරිනියක් ලෙස තවමත් සේවයේ යෙදී සිටියි. ඒ අනුවද වගඋත්තකකාර ආයතනයේ ක්‍රියාකාරකම් මත මෙම ඉල්ලුම්කාරියට අගතියක් සිදුව ඇති බව පැහැදිලි වේ.

2011.08.01 දින දරන මෝසම් පත්‍රයෙන් ඉල්ලා සිටි ලේඛන සහ ලිපි ගොනු අධිකරනය වෙත ඉදිරිපත් කිරීමට වගඋත්තකකාර පාර්ශ්වය දිගින් දිගටම අතපසු කොට තිබීම හේතුවෙන්ද ඉල්ලුම්කාරිය හට අගතිය බලවත් සේ සිදු විය. මෝසම් පත්‍රයෙන් ඉල්ලා ඇති ලේඛන යොමුවේ සඳහන් කරුණු නිරාකරණය සඳහා අදාළ නොවන බවට වගඋත්තරකරුගේ නීතිඥ මහතා සඳහන් කරයි. (2012.03.23 දින ගොනුවේ 217 පිටුව) එසේ සඳහන් කොට ලබා දුන් නිශාන්ත බණ්ඩාර නැමති අය මූලික ප්‍රශ්න, හරස් ප්‍රශ්න, නැවත ප්‍රශ්න විමසීමෙන් අනතුරුව මුදා හැර ඇත. ඔහු නැවතත් සාක්ෂි සඳහා කැඳවීමට අයැද සිටියේය. ඊට ඉල්ලුම්කාරිය වෙනුවෙන් විරෝධය පෑම හේතු කොට ගෙන ඔහු වෙනුවට අධ්‍යක්ෂ මානව සම්පත් කළමනාකරන හා මානව සම්පත් සංවර්ධන සාක්ෂි දීමට ඉදිරිපත් විය.

ඉමමම ඉල්ලුම්කාරිය 1995.06.01 වෙනි දින සිට වගඋත්තරකාර ආයතනයේ vii වන ශ්‍රේණියේ ලිපිකාරිනියක ලෙස සේවයට බඳවා ගෙන ඇත. වගඋත්තරකාර ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව vii වන ශ්‍රේණියේ වසර 02 සම්පූර්ණ කළ විට vi වන ශ්‍රේණියේ උසස්වීම 1997.06.01 සිට ලැබිය යුතුය. එහෙත් එම අසස්වීම ලබා දී ඇත්තේ 2007.09.04 දින දීය. ඒ වන විට ඉල්ලුම්කාරිය මීට උසස් තනතුරක් දැරිය යුතුව ඇත.

ඇතැම් අවස්ථාවන්හිදී කොමිෂන් පත්‍රිකා සැකසීම ආදී සුවිශේෂ කටයුතු පවා නියමිත අයගෙන් පරිබාහිර අයවලුන් විසින් ක්‍රියා කොට ඇතැම් උසස්වීම් ලබා දී ඇති බව සාක්ෂි හෙළි විය.

ඉහත සඳහන් සියළු කරුණු සැලකිල්ලට ගැනීමේදී යොමුවේ සඳහන් එනම්, "ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් 2000 හා 2001 වර්ෂවලදී v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර සහ iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරුවලට උසස්වීම් ලබාදීමේදී ඒ සඳහා අයදුම් කරනු ලැබූ එහි vii වන ශ්‍රේණියේ ලිපිකාරිනියක් වශයෙන් සේවයේ යෙදී සිටි උදුල් ඉන්ද්‍රානි දොඩංගොඩ මෙනවියට එම උසස්වීම ලබා නොදීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්නට පිළිතුර වනුවේ "ඔව්" යන්න වේ. අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමි විය යුතුද' යන්නට පිළිතුර පසුව ඉදිරිපත් කෙරේ.

02. "ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂන් සභාව විසින් 2007 වර්ෂයේදී iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරුවලට උසස්වීම් ලබා දීමේදී ඒ සඳහා අයදුම් කරනු ලැබූ එහි vii වන ශ්‍රේණියේ ලිපිකාරිනී උදුලා ඉන්ද්‍රානි දොඩංගොඩ මෙනවියට එම උසස්වීම් ලබා නොදීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් වූයේද යන්න හා අසාධාරණයක් වූයේනම් ඇයට කුමන සහනයක් හිමි විය යුතුද යන්නට" පිළිතුරද ඔව් යන්නයි. හිමිවිය යුතු සහනය පහත දැක්වේ.

03. "1995.06.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ vii වන ශ්‍රේණියේ ලිපිකාරිනියක වශයෙන් ස්ථිර පත්වීමක් ලැබූ උදුලා ඉන්ද්‍රානි දොඩංගොඩ මෙනවියට එම තනතුරෙහි ශ්‍රේණිගත උසස්වීම් ලබා දීම එම කොමිෂන් සභාව විසින් 2008 වර්ෂය දක්වා ප්‍රමාද කිරීම හේතුවෙන් ඇයට යම් අසාධාරණයක් සිදු වූයේද යන්න හා අසාධාරණයක් වූයේ නම් ඇයට කුමන සහනයක් හිමි විය යුතුද යන්න පිළිබඳව වේ" යන්නයි. සහනය පිළිබඳව මතු දැක්වේ.

යොමුවේ සඳහන් කරුණු තුනටම පිළිතුර "ඔව්" යන්නයි.

එසේ නම් හිමිවිය යුතු සහනය මෙසේය. 1995.06.01 සිට vii වන ශ්‍රේණියේ ලිපිකාරිනියකව සිටි ඉල්ලුම්කාරියට 1997.06.01 දිනට ලැබිය යුතු ලිපිකරු vi වන ශ්‍රේණිය ලබා දී ඊට අදාළ වැටුප් තලයේ පිහිටුවීමද, වර්ෂ 2000 දී v වන ශ්‍රේණියේ මාණ්ඩලික සහකාර තනතුර 2000.06.01 සිට පිහිටුවීමද, ඉන් පසු දෙවර්ෂයක් ඉක්ම වූ දිනට එනම්, 2002.06.01 සිට iv වන ශ්‍රේණියේ සහකාර අධ්‍යක්ෂ තනතුරෙහි පිහිටුවා එකී සියළු තනතුරු සඳහා හිඟ වැටුප් සහිතව අදාළ වැටුප් තලයේ තැබීමද, ඉන් පසුව වර්ෂ තුනක් ඉක්ම වීමෙන් පසුව වගඋත්තරකරුගේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව ලැබිය යුතු වූ අධ්‍යක්ෂ තනතුරුද අදාළ පුරප්පාඩු පවතී නම් ලබා දීමටත්, ඉක්බිතිව අදාළ වැටුප් තලයේ පිහිටුවීමත් ඉල්ලුම්කාරියට ලබා දිය යුතු සහනයක් ලෙස නිර්දේශ කරමි.

මෙම ප්‍රදානය යුක්තිසහගත හා සාධාරණ බව සහතික කරමි. මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී මසක් ඇතුළත ඉටුවිය යුතු යැයි නිගමනය කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණයේ බේරුම්කාර
මණ්ඩලයේ සාමාජික.

2013 සැප්තැම්බර් මස 30 වන දී ය.

12 - 26